RG/NB/01/චක්‍රලේඛ

2019.06. 28

චක්‍රලේඛ අංක 10/2019

සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

**<u>2011 අංක 47 දරණ නොතාරිස් (සංශෝධන) පනත</u>**

**<u>මාසික ලැයිස්තුවේ පිටපතක් භාරදීම</u>**

ඉහත සංශෝධන පනතේ 03 වන වගන්තියට අනුව නොතාරිස්වරයෙකු විසින් තමා එක් එක් මාසය තුළ ලියා සහතික කළ ලේඛන ලැයිස්තුවේ පිටපතක් ඉඩමට අදාළ පළාත් පාලන ආයතනය වෙත යැවිය යුතුය. නොතාරිස්වරුන් මෙම ලැයිස්තුවේ පිටපතක් තම ආයතනය වෙත ලබානොදෙන බව පළාත් පාලන ප්‍රධානීන් මා වෙත දන්වා ඇත.

02. නොතාරිස් ආඥා පනතේ විධිවිධාන කඩ කිරීම එහි 21(1) ඇ වගන්තිය යටතේ වරදක් වන අතර ඉහත කී ලැයිස්තුවේ පිටපතක් අදාළ පළාත් පාලන ආයතනය වෙත යැවීම සඳහා ඔබ කාර්යාලයට අයත් නොතාරිස්වරුන් දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙස දන්වමි.

එන්.සී. විතානගේ
රෙජිස්ට්‍රාර් ජනරාල්
ō/ɩ

පිටපත : 01. ගරු නගරාධිපතිනිය, කොළඹ මහ නගර සභාව - කරු. දැන ගැනීම සඳහා
02. සභාපති, ශ්‍රී ලංකා නීතිඥ සංගමය - ඔබ සංගමයට අයත් නොතාරිස් වෘත්තියේ යෙදෙන නීතිඥ මහත්ම මහත්මීන් දැනුවත් කිරීම සඳහා
03. සභාපති, නොතාරිස් සංගමය - ඔබ සංගමයට අයත් නොතාරිස් වෘත්තියේ යෙදෙන නීතිඥ මහත්ම මහත්මීන් දැනුවත් කිරීම සඳහා
04. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් - කරු. දැන ගැනීම සඳහා
05. සියළුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - කරු. දැන ගැනීම සඳහා